**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන - 2019**

---

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3119 එස්ආර්අයි (එස්එෆ්) සහ 3120 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම්වල iv ව්‍යවස්ථාවේ 4.04(අ) වගන්තිය සහ 2018 මැයි 11 දින එළඹි අංක 3650 එස්ආර්අයි(සීඕඑල්) සහ 3651 එස්ආර්අයි දරන අතිරේක ණය ගිවිසුම් වල විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹි අංක 5516 එල්කේ හා 5517 එල්කේ දරන ගිවිසුමේ 11බී 3 වගන්තියේ 2 වන උප ලැයිස්තුව ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

---

වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල සහ වැඩසටහන් ණය ගිවිසුම අනුව, එවකට නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය එනම් වත්මන් අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර අනෙකුත් ආයතන 10 ක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. 2020 වනවිට දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපලේ ඉල්ලුම සපුරාලීමට කාර්යක්ෂම අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම හා වෘත්තීය පුහුණුව සඳහා තත්ත්වය, අදාළතාවය, ප්‍රවේශය, පිළිගැනීම මෙන්ම උපකාරක ප්‍රතිපත්ති, පද්ධති හා ආකෘති වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. වැඩසටහන් ක්‍රියාකාරකම් ප්‍රතිඵල පදනම් (lending mode) ක්‍රමය අනුව ක්‍රියාත්මක වේ. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල ප්‍රකාරව සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන් කරන ලද අතිරේක ප්‍රතිපාදනද ඇතුලත්ව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 141,524.23 කට සමාන එජඩො මිලියන 1,061.2 ක් වූ අතර ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය පිළිවෙලින් රු.මිලියන 28,708.23 කට සමාන එජඩො මිලියන 200 ක්ද, රු.මිලියන 13,100 කට සමාන එජඩො මිලියන 100ක්ද බැගින් ලබාදී තිබුණි. ඉතිරිය එජඩො මිලියන 761.2 ක් ජර්මන් රජය, කොරියාවේ අපනයන හා ආනයන බැංකුව, ශ්‍රී ලංකා රජය හා අනෙකුත් ප්‍රභවයන් විසින් මූල්‍යායනය කර තිබුණි. වැඩසටහනෙහි කටයුතු 2014 වර්ෂයේ සැප්තැම්බර් ආරම්භ කරන ලද අතර 2021 ජුනි 30 වනවිට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ඒකාබද්ධ වියදම් ප්‍රකාශනයේ 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයක් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතිය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විමට ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරිම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සමස්ත ඉදිරිපත් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගනන විෂය පථයද පුළුල් කර ඇත.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව වගකීම් දරන්නන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව / විගණන ගැටළුව | වටිනාකම | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය 2020 සැප්තැම්බර් 08 දින වන විටත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | | අදාල ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතන සම්බන්ධයෙන් ඒකාබද්ධ වියදම් ප්‍රකාශනයේ ඇතුලත් කර තිබූ මූල්‍ය තොරතුරු සංසන්දනය කිරීමට නොහැකි විය. | වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනයෙහි ආරම්භක ශේෂයන්හි පැවති වෙනස්කම් නිසා, රජයේ විගණන අංශය විසින් මූල්‍ය ප්‍රකාශන ආපසු ලබාදී තිබුණද, 2020 සැප්තැම්බර් 17 දින තෙක් නැවත ඉදිරිපත් කර නොතිබුණි. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, 2020 සැප්තැම්බර් 24 දිනට පැවැත්වීමට නියමිත පාලක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන බව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් දැනුම් දී ඇත. | ප්‍රධාන මූල්‍ය නිලධාරීන් විසින් ඒකාබද්ධ වියදම් ප්‍රකාශන තුල ඇතුලත් මූල්‍ය තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කල යුතුව ඇත. |
| (ආ) | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 3.4 ප්‍රකාරව නොපියවූ අත්තිකාරම් ගිණුම්, මුදල් හා මුදල් සමාන දෑ | මිලියන 5.35 | ඒකාබද්ධ ආදායම් හා වියදම් ප්‍රකාශනයේ මුළු වියදම් | ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විගණන | මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන දෝශ නිවැරදි කළ යුතු වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශන තුළ වියදම් ලෙස දක්වා තිබුණි. | | අධිතක්සේරු වී තිබුණි. | නිරීක්ෂණ සමග එකඟ වී ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂයන් සිදු නොවීමට පියවර ගනු ඇත. | |
| (ඇ) | ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ එකතුව රු. මිලියන 2.63 ක් වූ විවිධ ආදායම්, ඒකාබද්ධ ආදායම් හා වියදම් ප්‍රකාශනයේ වැඩියෙන් දක්වා තිබුණි. | මිලියන 1.2 | අධිතක්සේරු වී ඇත. | ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විගණන නිරීක්ෂණ සමග එකඟ වී ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂයන් සිදු නොවීමට පියවර ගනු ඇත. | මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන දෝශ නිවැරදි කළ යුතු වේ. |
| (ඈ) | වැඩසටහනෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 3.1 ප්‍රකාරව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය තොරතුරු මුදල් පදනම මත පිළියෙල කිරීම අවශ්‍ය වේ. එසේ වුවද වැඩසටහනෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට අදාල ආදායම් හා වියදම් දත්ත උපචිත පදනමට පිළියෙල කර තිබුණි. | - | ප්‍රමාණවත් ලෙස මූල්‍ය තොරතුරු හෙළිදරව් නොවීම. | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් විගණන නිරීක්ෂණ සමඟ එකඟ වී ඇත. | ඒකාබද්ධ කිරීමට පෙර ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පෙර වර්ෂයේ ආදායම වැරදීමකින් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා තිබුණි. | මිලියන 21.47 | නොගැළපෙන හෙළිදරව් කිරීමකි. | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් විගණන නිරීක්ෂණ සමඟ එකඟ වී ඇත. | දෝෂය නිවැරදි කළ යුතුය. |
| (ඊ) | වැඩසටහනෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමඟ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ආදායම් හා වියදම් ප්‍රකාශනය සැසඳීමේදී, වියදම් අයිතම 17 ක රු. 3,000 සිට රු. 4,971,000 දක්වා වූ පරාසයක වෙනස්කම් නිරීක්ෂණය විය. | - | නිරවද්‍ය මූල්‍ය තොරතුරු ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයෙන් නිරූපනය නොවේ. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයහි ඇතුළත් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට අයත් මුළු වියදමෙන් නිරීක්ෂණය වූ වෙනස්වීම් | ප්‍රධාන මූල්‍ය නිලධාරීන් විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කිරීමට ප්‍රමාණවත් හා නිරවද්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

කොමිෂන් සභාව විසින් සාධාරණීකරණය කර ලබාදී ඇත.

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| අංකය | 2019 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය | 2019 දෙසැම්බර් 31 දිනට ලඟාකර ගත් කාර්යසාධනය | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව, නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන පුහුණු පාඨමාලා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා රු. මිලියන 70.10 ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. මිලියන 43.50ක වියදමක් දරා තිබූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 62.05 ක් විය. | අපේක්ෂිත ඉලක්කය ළඟා කර ගෙන නොතිබුණි. | ගුණාත්මක පුහුණුවක් සඳහා පවතින ඉල්ලුම සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් ජාතික තරුණ සේවා සභාව වෙත රු.මිලියන 70.10 ක ප්‍රතිපාදනයක් වෙන් කරනු ලැබුවද, ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන සම්පූර්ණයෙන් භාවිතා කිරීමට නෙහැකි වී තිබුණි. | අපේක්ෂිත ඉලක්කය සම්පූර්ණ කිරීම සඳහා ඉදිකිරීම් පරිපාලනයේ දුර්වලතා අවම කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර එකග වූ අංක 5516 එල්කේආර් සහ 5517 එල්කේආර් දරන ණය ගිවිසුම් අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉලක්ක උපයෝජනය එස්ඩීආර් 65,700,000 ක් විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එස්ඩීආර් 34,320,000ක් උපයෝජනය කර තිබූ අතර එය මුලු ඉලක්කයෙන් සියයට 52.24 ක ප්‍රතිශතයක් විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විට උපයෝජන දර්ශක 8 යටතේ ළගා කර ගත යුතු ඉලක්කයන් 17 ක් ලගා කර ගැනිමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ණය ගිවිසුමේ වලංගු කාලය අවසන් වි තිබුණි. | | | බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි | 2017 නොවැම්බර් සිදු කරන ලද සමාලෝචනය අවසානයේදී වැඩසටහනේ කාර්යයන් සහ උපයෝජන දර්ශක ප්‍රතිව්‍යුහගත කිරීමට ලෝක බැංකුව සමඟ යෝජනා කරන ලදී. ඒ අනුව ලෝක බැංකුව විසින් 2017 වර්ෂය සහ ඊට පෙර කාලපරිච්ඡේදය සඳහා අපේක්ෂිත | අරමුදල් පරිහරණය කිරීමේ අකාර්යක්ෂම තාවය පෙන්නුම් කර ඇත. ණය ගිවිසුම් යටතේ වන උපයෝජන දර්ශකයන්හි ක්‍රියාකාරකම්ව ල ඉලක්කයන් සපුරා ගැනීම කෙරෙහි කළමණාකර ණයේ |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඉලක්ක දෙකක් පමණක් ලඟා කර ගැනීමට එකඟ වූ අතර පැරණි ඉලක්ක සඳහා තවදුරටත් ප්‍රතිපාදන ලබාදීම නතර කරන ලදී. කෙසේ වුවද, ලෝක බැංකුව සමඟ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් වැඩසටහනේ කාර්යයන් නව ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ගිවිසුමකට නොඑළඹෙන ලදී. තවද. 2017 වර්ෂය සහ ඊට පෙර උපයෝජනයන් සඳහා ගෙවීම් නවතන ලදී. | අවධානය යොමු විය යුතුය. |
| (ඇ) | ජාතික තරුණ සේවා සභාවේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව, අඩු වරප්‍රසාද සහිත සිසුන් 100ක් වෙනුවෙන් මූල්‍ය සහාය ලබා දීම සඳහා වසරකට රු. මිලියන 4.8 බැගින් වර්ෂ 2014 සිට 2020 දක්වා වන කාලසීමාව වෙනුවෙන් රු. මිලියන 33.6 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වුවද, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විටත් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. | වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා මූල්‍ය දුෂ්කරතා සහිත සිසුන් ආකර්ශනය අඩු මට්ටමක පවතී. | වර්ෂ 2014 සිට 2020 දක්වා වන කාලපරිච්ඡේදය සඳහා වෘත්තීයික හා තෘතීයික අධ්‍යාපන පුහුණු අංශයේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මෙහි අඩු වරප්‍රසාද සහිත අභ්‍යාසලාභීන් සඳහා දීමනා ගෙවීමකට අපේක්ෂිතව තිබුණද, ජාතික තරුණ සේවා සභාව විසින් අඩු ආදායම්ලාභී අභ්‍යාසලාභීන් සඳහා අරමුදල් සම්පාදනය කිරීමට | වැඩසටහනේ මූල්‍ය දායකත්වය තුලින් මෙම කාර්යය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වර්ෂ 2014-2020 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා පිළියෙළ කරන ලද විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මෙන් යෝජනා කර තිබුණද නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන විසින් අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණි. | |
| (ඇ) | විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව, ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වා ගෙන යනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම පිළිබඳව ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම අරමුණු කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පාඨමාලා ගාස්තු සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණු අතර මධ්‍යස්ථාන වල ක්‍රියාත්මක වන එකම පාඨමාලාව සඳහා විවිධ ගාස්තු අයකරමින් පාඨමාලා ආරම්භකර ක්‍රියාත්මක කර තිබුණි. | මෙම තත්ත්වය ජාතික තරුණ සේවා සභාවේ පුහුණු පාඨමාලා සඳහා පවතින ඉල්ලුමට අහිතකර ලෙස බලපානු ඇත. | 2020 දෙවන අධ්‍යයන වාරයේ සිට පූර්ණ කාලීන, අර්ධ කාලීන සහ කෙටි කාලීන පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. | සභාවේ පවතින රෙගුලාසි වලට යටත්ව ප්‍රතිපත්තියක් සකස් කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව, ජාතික තරුණ සේවා සභාවේ නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ වන පුහුණු මධ්‍යස්ථාන සඳහා උපදේශකවරුන් 55 දෙනෙකු බඳවා ගනිමින් අධයයන කාර්යය මණ්ඩලය සියයට 80ක් දක්වා වර්ධනය කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට උපදේශකවරුන් 34 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. | පුහුණු පාඨමාලාවල ගුණාත්මක භාවය ඉහළ නැංවීමේදී ගැටළු මතු වීම. | ජාතික තරුණ සේවා සභාවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව 2019 වර්ෂය සඳහා උපදේශකවරුන් 65 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ වෘත්තීය පුහුණු අංශය වෙත උපදේශකවරුන් 34 ක් බඳවාගෙන තිබුණි. කෙසේ වුවද, 2020 | පුහුණු අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් හා සුදුසුකම්ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් පත් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

අගෝස්තු 31 වන දිනට ජාතික තරුණ සේවා සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ උපදේශකවරුන් ප්‍රමාණය 82% ක් දක්වා සම්පූර්ණ වී තිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ ජාතික තරුණ සේවා සභාව විසින් පිළියෙළ කරන ලද විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව අතිරේඛ පුහුණු අභ්‍යාසලාභීන් 1700 ක් බිහිකිරීම සඳහා පුහුණු මධ්‍යස්ථාන 10 ක් නවීකරණය කිරීමට රු. මිලියන 611 ක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විට රු. මිලියන 438 ක් වැය කර මධ්‍යස්ථාන 6ක් නවීකරණය කර තිබුණි. ඉන් පුහුණු මධ්‍යස්ථාන දෙකක නවීකරණ කටයුතු වෙනුවෙන් රු. මිලියන 114.9 ක් වැය දැරීමෙන් පසු කොන්ත්‍රාත්කරුගේ දුර්වලතා හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. තවද, නවීකරණ කටයුතු වෙනුවෙන් රු. මිලියන 50.3ක වියදමක් දැරීමෙන් පසු ඉදිකිරීම් කටයුතු වල මන්දගාමී ස්වභාවය මත එක් පුහුණු මධ්‍යස්ථානයක ඉදිකිරීම් නවතා දැමීමට සිදු වී තිබුණි. | ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැතිවීම,පාඨමාලා සඳහා පවතින ඉල්ලුම කෙරෙහි අහිතකර බලපෑමක් සිදු කරයි. | විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව, ජාතික තරුණ සේවා සභාව විසින් නිපුණතා ආංශික සංවර්ධන අංශයේ මූල්‍ය ප්‍රතිපාදන මත පුහුණු මධ්‍යස්ථාන 10 ක නවීකරණ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වුවද, මධ්‍යස්ථාන 6 ක පමණක් නවීකරණ කටයුතු සිදු කරන ලදී. තවද, පුහුණු මධ්‍යස්ථාන 3 ක නවීකරණ කටයුතු නිමකර පාඨමාලා ආරම්භ කරන ලදී. | කොන්ත්‍රාත්කරුවන් වෙත පවරා ඇති සිවිල් කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණය විසින් අඛණ්ඩ අධීක්ෂණයක් හා වැඩි අවධානයක් යොමු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ඉදිකිරීමට යෝජිතව තිබූ රත්මලාන හා හොරණ ගොඩනැගිලි සඳහා 2014 අගෝස්තු 5 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. 2019 මාර්තු හා අප්‍රේල් මාසයන් තුල එම ඉදිකිරීම් කටයුතු නිමකිරීමට යෝජිතව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිම වී නොතිබුණි. තවද, 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 295.77 ක් වූ රත්මලාන හා හොරණ ගොඩනැගිලිවල භෞතික ප්‍රගතිය පිළිවෙළින් සියයට 45 ක් සහ සියයට 85 ක් විය. | ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් වෘත්තීය පුහුණු අංශයේ ඉල්ලුම සපුරාලීමට නොහැකි වී ඇත. | ඉදිකිරීම් ප්‍රමාදය සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් විවිධ හේතු දක්වා ඇත. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා කළමණාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් රු. මිලියන 9.7 ක ඇස්තමේන්තු වටිනාකමක් මත හැව්ලොක් නගර කාර්යාලය 2016 දෙසැම්බර් 30 දිනට නිම කිරීමට එකඟ වී තිබුණද අදාළ කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව හැරදමා ගොස් තිබුණි. 2018 සැප්තැම්බර් 26 දින වන තෙක් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන විසින් නැවත ඉදිකිරීම් ආරම්භ කිරීමට අවදානය යොමු නොකිරීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන අහිමි වී තිබුණි. කෙසේ නමුදු ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් දේශීය ප්‍රතිපාදන යොදා ගනිමින් කොන්ත්‍රාත්තුව වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රදානය කර තිබුණි. | බලාපොරොත්තු වූ අරමුණ සාක්ෂාත් වී නොතිබුණි. | ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ඉදිකිරීම් ප්‍රමාදවීම සම්බන්ධයෙන් විවිධ හේතු දක්වා තිබුණි. | ඉදිකිරීම් කටයුතු වල ප්‍රමාදයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඈ) | විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පුහුණු මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 3,495 ක් ඇස්තමේන්තු ගත කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුහුණු මධ්‍යස්ථාන 14 ක ඉදිකිරීම් කටයුතු | පුහුණු මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු ප්‍රමාදය හේතුවෙන් වෘත්තීය පුහුණු අංශයේ ඉල්ලුම සපුරාලීමට නොහැකි වී ඇත. | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කළමණාකරණය විසින් විගණන නිරීක්ෂණ සමඟ එකඟ වී ඇත. ක්‍රියාකාරී සැලැස්ම අනුව ශ්‍රී ලංකා | ඉදිකිරීම් හා නවීකරණය සඳහා හඳුනාගෙන ඇති පුහුණු මධ්‍යස්ථාන වල එම කටයුතු කඩිනම් කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කල යුතුය. |

| | | |
|---|---|---|
| | ආරම්භ කර නොතිබුණි. තවද, ඉතිරි මධ්‍යස්ථාන 6 න් මධ්‍යස්ථාන 4 ක ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම වී නොතිබුණු අතර එදිනට භෞතික ප්‍රගතිය සියයට 30 ක් විය. ඊට අමතරව පුහුණු මධ්‍යස්ථාන 90 ක් නවීකරණය කිරීම සඳහා රු. මිලියන 3,935 ක මුදලක් ඇස්තමේන්තු ගත කර තිබුණද ඉන් රු. මිලියන 857 ක් වැයකර පුහුණු මධ්‍යස්ථාන 27 ක නවීකරණ කටයුතු අවසන් කර තිබුණි. ඒ අනුව ළඟා කර ගෙන තිබූ භෞතික ප්‍රගතිය සියයට 31 ක් විය. | වෘත්තීය පුහුණු අධිකාරිය නව පුහුණු මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන මත මධ්‍යස්ථාන 7 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. ඉන් මධ්‍යස්ථාන 04 ක ඉදිකිරීම් අවසන් කර ඇත. |

### 3.3 ස්ථානීය පරීක්ෂා කිරීම්වල නිරීක්ෂණ

| අංකය | විගණන ගැටළුව | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේදී හඳුනාගත් ශ්‍රම වෙළඳපොල ඉල්ලුමක් සහිත පාඨමාලා 17 ක් ආරම්භ කිරීමේ අරමුණින් ජාතික තරුණ සේවා සභාවේ පානදුර, හලාවත හා රත්මලාන පුහුණු මධ්‍යස්ථාන නවීකරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර තිබුණේ පාඨමාලා 10 ක් පමණි. | පුහුණු ශ්‍රමය සඳහා පවතින වෙළඳපොල ඉල්ලුම සපුරාලීමට නොහැකි වීම | ජාතික තරුණ සේවා සභාව සමග සිදු කරන ලද සාකච්ඡාවෙන් අනතුරුව සැප්තැම්බර් 23 වන විට පිළිතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | අපේක්ෂිත ඉලක්ක ළඟාකරගැනීම සඳහා කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වෘත්තීය පුහුණු අධිකාරියේ 2014 සිට 2020 දක්වා පිළියෙල කර තිබූ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළ පුහුණු මධ්‍යස්ථාන 20 ක් තුලින් සිසුන් 15000 ක් පුහුණු කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වසරේ මුල් අර්ධ වර්ෂයේදී අභයාසලාභීන් 586 ක් පමණක් පුහුණු කර තිබුණි. | නිපුණතා සංවර්ධන අංශයේ පුහුණු අවශ්‍යතාවය සපුරාලිය නොහැකි වීම. | රාජ්‍ය භාණ්ඩාගාරයෙන් අරමුදල් නිදහස් කිරීම සීමා කිරීම හේතුවෙන් නව පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම සීමිත වූ අතර, අරමුදල් ලබාගැනීමේ සීමාව හේතුවෙන් පුනරුත්තාපනය හා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය ප්‍රමාද විය. එහි ප්‍රතිඵලයක් ලෙස අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ ප්‍රතිශතය පහත වැටී ඇත. | යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | දින 120 වැඩසටහන යටතේ වෘත්තීය පුහුණු අධිකාරිය විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ වඩු හා පෙදරේරු අංශයේ අභ්‍යාසලාභීන් 60 දෙනෙකු පුහුණු කිරීම සඳහා රු. මිලියන 06 ක් වෙන් කර තිබුණු අතර එක් අභ්‍යාසලාභියෙකු පුහුණු කිරීම සඳහා රු. 100,000 ක් වැය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද මෙම වැඩසටහන යටතේ අභ්‍යාසලාභීන් 37 දෙනෙකු පමණක් පාඨමාලා සම්පූර්ණ කර ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර (NVQ) ලබාගෙන ඇති අතර මෙම ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා එක් අභ්‍යාසලාභියෙකු සඳහා රු. 155,400 ක් වැය කර තිබුණි. | පුහුණු ශ්‍රමය සඳහා වෙළඳපොල ඉල්ලුම සපුරාලීමට නොහැකිය | වඩු හා පෙදරේරු පාඨමාලා ඉලක්ක කර 2018 වර්ෂයේදී මොණරාගල දිස්ත්‍රික්කයේ දින 120 වැඩසටහන යටතේ වැඩසටහන් දියත් කළ අතර එක් කණ්ඩායමකට අභ්‍යාසලාභීන් 20 බැගින් මුළු අභ්‍යාසලාභීන් 40 දෙනෙකු ඉලක්ක කර තිබුණි. ඒ අනුව විගණන නිරීක්ෂණ මගින් පෙන්වා දී ඇති අභ්‍යාසලාභීන් සංඛ්‍යාව නිවැරදි විය යුතුය. උක්ත වැඩසටහන් සඳහා අභ්‍යාසලාභීන් 37 දෙනෙකු එනම් ඉලක්කගත අභ්‍යාසලාභීන්ගෙන් සියයට 92.5 ක ප්‍රතිශතයක් බඳවාගෙන තිබුණි. මෙම වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත අයවැය රු. මිලියන 8.78 ක් වූ අතර එක් අභ්‍යාසලාභියෙකු සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. 219,500 ක් විය. එසේ වුවද, එක් අභ්‍යාසලාභියෙකු සඳහා වැය කළ සත්‍ය පිරිවැය රු. 155,400 ක් විය. | අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකරගැනීම සඳහා අවධානය යොමු කළ යුතුය. |

### 3.4 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලා 04 ක සිසුන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීමේ අරමුණින් අහංගම පැවති හෝටල් පාසල | අපේක්ෂිත පරමාර්ථ සාක්ෂාත් කරගත නොහැකි වීම. | පෞද්ගලික - රාජ්‍ය හවුල්කාරීත්වය යටතේ මෙම ස්ථානය ආදර්ශ හෝටලයක් ලෙස පවත්වා ගෙන යාම සඳහා පුහුණුවීම් | අපේක්ෂිත ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා හෝටලයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| නවීකරණය කර සංචාරක හෝටලයක් බවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 124.69 ක් වැයකර තිබුණි. ශක්‍යතා අධ්‍යනයකින් තොරව හෝටල් පාසල නවීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, සංචාරක කර්මාන්තයට අදාළ වෘත්තීය පුහුණු පහසුකම් ලබා දීමකින් තොරව හෝටල් ගොඩනැගිල්ල අධිකාරියේ ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා භාවිතා කර තිබුණි. තවද, වර්ෂ 2016 – 2019 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පිරිවැය රු. මිලියන 24.24 ක් වූ පුහුණු උපකරණ සහ අනෙකුත් උපකරණ සමාලෝචිත වර්ෂය අවසානයේදී අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන අක්‍රීයව පැවතුණි. | | කිරීමට අවස්ථා කිහිපයකදී උත්සහ දැරුවද එය අසාර්ථක විය. | |

**3.5 මතභේදයට තුඩුදෙන කරුණු**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලට අදාල පුහුණු මධ්‍යස්ථානවල සිවිල් වැඩ ප්‍රමාදවීම. | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ සමස්ථ ඉලක්කය ළඟාකරගැනීමට නොහැකි වී ඇත. | අරමුදල් සීමා කිරීම්, කොන්ත්‍රාත්කරුවන්ගේ අකාර්යක්ෂමතාවය වැනි විවිධ හේතූන් සඳහන් කර තිබුණි. | පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීමේ කටයුතුවල අනවශ්‍ය ප්‍රමාදයන් වලක්වා ගැනීමට සෑම ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයකම කළමනාකරණය අවශ්‍ය පියවර ගත යුතුය. |